# 2025 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

## අතුරලිය ප්‍රාදේශීය සභාව.

01. **2025** වර්ෂය තුල මෙම සභාවට අයත් පහත ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමති සුදුසුකම් ලත් පිළිගත් සැපයුම්කරුවන්ගෙන් සහ නිෂ්පාදකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01) සැපයුම් :**

- I. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය , මුද්‍රිත පොත්, පරිගණක මුද්‍රණ ද්‍රව්‍ය හා පරිගණක පාරිභෝගික ද්‍රව්‍ය.
- II. සියලුම ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය, ජල නල උපකරණ හා තීන්ත වර්ග ආශ්‍රිත ද්‍රව්‍ය,සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ,විදුලි සේවා ආශ්‍රිත ආරක්ෂිත උපකරණ (ඉදල්, කොසු, බුරුසු, පාපිසි, වේවැල් කූඩ, ප්ලාස්ටික් කුණු කූඩ, විම්, සබන්, හාපික් හා විෂබීජ නාශක, අත් වැසුම්, මුහුණු ආවරණ, වැහි කබා, ගම් බූට්ස්, සපත්තු, මේස් ආදිය)
- III. නිල ඇඳුම් සඳහා රෙදි ,සපත්තු ,මේස් හා තිර රෙදි සඳහා අවශ්‍ය රෙදි වර්ග සැපයීම හා මැසීම.
- IV. ටයර්,ටියුබ්,බැටරි හා සියලුම රථ වාහන අමතර කොටස් සැපයීම.
- V. විදුලි හා වීථි පහන් උපකරණ, වයරින් ද්‍රව්‍ය හා විද්‍යුත් උපකරණ හා CCTV උපාංග සැපයීම.
- VI. පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, අනුපිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර,වේලාව සටහන් කිරීමේ උපකරණ හා ආශ්‍රිත උපාංග සැපයීම හා අලුත්වැඩියාව.
- VII. කාර්යාල උපකරණ, ලී, වීදුරු සහ වානේ ගෘහ භාණ්ඩ ආදිය .
- VIII. කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන (හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, මායිම් ගල්,බෝක්කු බට,කම්බි කණු ආදිය)
- IX. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය දැව වර්ග, ලී, ලෑලි සැපයීම.
- X. තාර, ප්‍රීමික්ස්, කළුගල්, වැලි, පස් හා බොරළු ඇතුළු මාර්ග නඩත්තුවට අදාළ ද්‍රව්‍ය හා උපකරණ.
- XI. සියලුම ඇලුමිනියම් ,සුදු යකඩ වැඩ හා පෑස්සුම් කටයුතු.
- XII. උදලු,සවල්,රේක්ක,කැති,පිහියා,වල් කපන යන්ත්‍ර තල, මුල්ලු, විල්බැරෝ, වතුර මෝටර් හා අලවංගු ආදී අනෙකුත් කම්කරු උපකරණ, කෘෂි උපකරණ සහ ආයුධ.
- XIII. බැනර්,කොඩි, ඩිජිටල් ප්‍රින්ටින්,පෝස්ටර්,ආරාධනා පත්‍ර හා ස්ටිකර්,සමරු ඵලක හා නිල මුද්‍රා සකස් කිරීම.

**02) වැඩ හා සේවා සැපයීම**

- I. ද්‍රව්‍ය ප්‍රවාහන හා මගී ප්‍රවාහන සඳහා වාහන, උපකරණ,ස්කැවේටර් හා බොබ්කැට් යන්ත්‍ර , බැකෝ රථ ,මාර්ග සැකසීම් උපකරණ වැනි යන්ත්‍ර සූත්‍ර කුලී පදනම මත සැපයීම. ගලි බවුසර් ඇතුළු සියලු පවිත්‍රකරණ සේවා සැපයීම.
- II. මෝටර් ග්‍රේඩර්, බැකෝ රථ, විදුලි ජනක යන්ත්‍ර, චේන්සෝ යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර, බොබ්කැට් යන්ත්‍ර ආදී යන්ත්‍ර සූත්‍ර සේවා කිරීම හා අලුත්වැඩියාව.
- III. රක්ෂණ සේවා සැපයීම, නීතිඥ සේවා සැපයීම, මිනින්දෝරු සේවා සැපයීම
- IV. පරිගණක ජාලගත කිරීම හා අභ්‍යන්තර දූරකථන සේවා සැපයීම.
- V. ගස් කැපීම, වඩු උපකරණ සැපයීම හා සැකසීම.
- XIV. සියලුම වාහන අලුත්වැඩියාව සේවා සිදු කිරීම , වාහන විදුලි පද්ධති සැකසීම හා අළුත්වැඩියාව
- VI. ගොඩනැගිලි,මාර්ග ඉදිකිරීම් හා නඩත්තු සේවා ,කොන්ත්‍රාත් (රු. ලක්ෂ පහට වැඩි හා අඩු ලෙස)

**කොන්දේසි**

01.ලේකම්,අතුරලිය ප්‍රාදේශීය සභාව නමට ලියන ලද රු.1000.00 ක චෙක්පතක් එවීමෙන් හෝ සභාවට පැමිණ මුදල් ගෙවීම මගින් ලියාපදිංචි විය හැක.ඉහත අංකනය කරන ලද සැපයුම් උපකරණ හා සේවා කිහිපයක් සඳහා ලියාපදිංචි වන්නේ නම් වෙන් වෙන් වශයෙන් ගෙවීම් කළ යුතුය.

02. අයදුම්කරුවන්ගේ නම, ව්‍යාපාරයේ නම සහ ලිපිනය ,දුරකථන අංකය ,ෆැක්ස් අංකය හා ව්‍යාපාර ලියාපදිංචි අංකය ,චෙක්පත් එවිය යුතු ආකාරය හා සැපයීමට අපේක්ෂා කරන සැපයුම් උපකරණ හෝ සේවාව සඳහන් කර ඔබ විසින් පිළියෙල කල අයදුම්පත ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2025 යනුවෙන් සඳහන් කර 2024.12.10 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්,අතුරලිය ප්‍රාදේශීය සභාව, දොස්තර සුගීෂ්වර වික්‍රමසිංහ මාවත ,තිබ්බොටුවාව ,අකුරැස්ස යන ලිපිනයට එවිය යුතුය.

03. ලියාපදිංචි වන සියලුම සැපයුම් කරුවන් දින 14 ත් දින 30 අතර ණය කාලසීමාවක් සඳහා අනිවාර්යයෙන් ලිඛිත එකඟතාවය පළ කල යුතු අතර එසේ නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

04. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී 041-2284175 දුරකථන අංකයෙන් ලබා ගත හැක.

ජේ.පී.වී.එම්.ජී.ජී. ද අල්මේදා
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

අතුරලිය ප්‍රාදේශීය සභාවේදීය.